# සවියෙන් පෙරට – අපි එකට
# e - ඉගෙනුම් පාසල
# හොරණ අධ්‍යාපන කලාපය

## 08 ශ්‍රේණිය : පුරවැසි අධ්‍යාපනය – 1වාරය
## 1 පාඩම – පොදු සේවා

සැකසුම : නිරෝෂණි අමරතුංග
බප/කළු/බණ්ඩාරගම ජාතික පාසල

# පොදු සේවා යනු

ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පොදුවේ සියලුම ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි වනසේ රජය හා පෞද්ගලික අංශය මගින් සපයන සේවා පොදු සේවා වෙයි.






# අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා



විදුලිය




ප්‍රවාහනය



තැපැල් සේවය



අධ්‍යාපනය



සෞඛ්‍යය





ආරක්ෂක සේවා

ජල සම්පාදනය

සමුපකාරය

පොදු සේවා මහජනතාවට සපයන ආකාරය අනුව කොටස් තුනකට වෙන්කළ හැකිය.



# පොදු සේවාවල අවශ්‍යතාවය

- ජන ජීවිතයේ එදිනෙදා කටයුතු පහසු කිරීමට
- ජනතාවගේ ජීවන තත්ත්වය පහසු කිරීමට
- සෑම පුද්ගලයෙකුටම සපයා ගත නොහැකි සේවා ලබා දීමට
- අඩු ආදායම් ලාභීන්ට සහන සැලසීමට
- පුද්ගලයන් අතර, ප්‍රදේශ අතර සබඳතා පවත්වාගෙන යාමට
- සමාජ සාධාරණත්වය තහවුරු කිරීමට
- සමාජ අවශ්‍යතා ඉටුකිරීම මගින් මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට
- භාණ්ඩ නිෂ්පාදනය,බෙදා හැරීම හා වෙළෙඳාම වැනි ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැපයීමට

# පොදු සේවාවල විකාශනය

- අනුරාධපුර රජවරු  වැවු , වාරිමාර්ග, රෝහල් ,ඔසු උයන් ආදිය මහජන ප්‍රයෝජනය සඳහා සකස් කිරීම

- අනුරාධපුර යුගයේ විසූ බුද්ධදාස රජු ගම් දහසකට එක් වෛද්‍යවරයෙකු බැගින් පත් කිරීම

- අනුරාධපුර  යුගයේ සිට ආගමික ස්ථාන මුල් කරගෙන අධ්‍යාපන ආයතන පැවති බවට සාධක ඇත

# බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවා



1 ප්‍රවාහනය
2 තැපැල් හා විදුලි පණිවුඩ සේවා
3 බැංකු සේවා





# පොදු සේවාවල අවශ්‍යතාවය තවදුරටත් වර්ධනය කිරීමට බලපාන හේතු

- අවශ්‍යතා සංකීර්ණ වීම
- ජන සංඛ්‍යාව වර්ධනය වීම
- අත්‍යවශ්‍ය සේවා ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලබන ජනතාවට සහන සැලසීමට හැකිවීම

# පොදු සේවාවල පොදු ලක්ෂණ

- සියලුම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැකිවීම
- ලාභ ඉපයීමට වඩා මහජන සුභ සිද්ධිය අරමුණු කරගෙන පවත්වාගෙන යාම
- ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පවතවා ගෙන යාම
- අඩු ආදායම් ලාභීන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම
- පුද්ගල සංවර්ධනය තුළින් සමාජ සංවර්ධනයට දායක වීම
- මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට සහාය වීම
- පොදු සේවා පවත්වාගෙන යාම හා ආරක්ෂා කිරීම සඳහා නීතිරීති පද්ධතියක් ක්‍රියාත්මක වීම

# අප ප්‍රදේශයේ පොදු සේවා

- ජල සම්පාදනය
- සෞඛ්‍ය සේවය
- අධ්‍යාපනය
- ප්‍රවාහනය
- විදුලිය
- පණිවිඩ හුවමාරු සේවා හා සන්නිවේදන සේවා
- ආරක්ෂක සේවා
- සමුපකාරය
- පරිසර සංරක්ෂණය

# ජල සම්පාදනය

පෘථිවි පෘෂ්ඨයෙන් 70% ක් ජලයෙන් වැසී තිබුණද පානීය ජලය ලෙස ප්‍රයෝජනයට ගත හැක්කේ 1%කටත් වඩා අඩු ප්‍රමාණයකි. ගංගා, ඇළ දොළ හා අභ්‍යන්තර ජලාශ රාශියක් රට තුළ පිහිටා තිබුණ ද පානීය ජලය ලෙස ප්‍රයෝජනයට ගත හැකි ප්‍රමාණය සීමිතය .



# පොදු සේවාවක් ලෙස පානීය ජලය සැපයීමට අවශ්‍ය වීමට හේතු

- දිවයිනේ සෑම ප්‍රදේශයකම අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් තරමට ජල සම්පත සුලභ නොවීම
- භූගත ජලය හා ගංගා ජලය විවිධ හේතුකාරක නිසා අපවිත්‍ර වීම
- නගරබද ප්‍රදේශවල ජන සංඛ්‍යාව අධික වීම
- වියළි කාලවල දී විවිධ ප්‍රදේශ ජල හිඟයකට මුහුණ පෑම
- ජන සංඛ්‍යා වර්ධනය සමග නිවාස ඉදි කිරීම සඳහා බිම් කැබලි කිරීම නිසා පිරිසිදු ළිං ජලය සපයා ගැනීම අපහසු වීම

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල මගින් ජල සැපයුම ලබා දීම, ඒවා නඩත්තු කිරීම අලුත්වැඩියා කිරීම වැනි කාර්යයන් ඉටු කෙරේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයක කාර්ය මණ්ඩලය

- ප්‍රාදේශීය ඉංජිනේරු
- වැඩ භාර නිලධාරි
- මනු කියවන්නන්
- ජල නළ වැද්දුම්කරුවන්
- කම්කරුවන් ආදීන්ගෙන් සමන්විත වේ.



# සෞඛ්‍ය සේවා

සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීමට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය දායකත්වය සපයයි. රෝග නිවාරණය හා රෝග සුව කිරීම සෞඛ්‍ය සේවාවෙන් ඉටුවන මූලික කාර්යය වේ .

- ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් ශ්‍රී ලංකාව මැලේරියාව දුරු කළ රටක් ලෙස ප්‍රකාශ කරන ලදී .

ශ්‍රී ලංකාවේ එවැනි සෞඛ්‍ය තත්ත්වයන් අත්කර ගැනීමට බලපෑ හේතු ලෙස

- ✓ සෞඛ්‍ය සේවාව රජය මගින් නොමිලේ සැපයීම
- ✓ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය අත්කර ගත් දියුණුව
- ✓ සෞඛ්‍ය සේවා දීප ව්‍යාප්තව සැපයීම
- ✓ පොදුජන සහයෝගය

# සෞඛ්‍ය සේවය මගින් ඉටු කරන කාර්යයන්



- රෝගීන්ට ප්‍රතිකාර කිරීම
- රෝග වැළැක්වීම හා පාලනය සඳහා ක්‍රියා කිරීම
- ප්‍රතිශක්තිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වෛද්‍ය සායන පැවැත්වීම
- මාතෘ සායන පැවැත්වීම
- රෝග විනිශ්චය සඳහා පර්යේෂණ පැවැත්වීම
- සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පාසල් සිසුන් සඳහා සායන පැවැත්වීම හා දන්ත චිකිත්සාගාර පවත්වාගෙන යාම
- හදිසි අනතුරු සේවා ක්‍රියාත්මක කිරීම
- ළදරුවන් හා මව්වරුන් සඳහා පවුල් සෞඛ්‍ය සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# දිවයින පුරා ක්‍රියාත්මක වන වෛද්‍ය ක්‍රම

දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය

සිද්ධ යුනානි හා හෝමියෝපති වෛද්‍ය ක්‍රම

බටහිර වෛද්‍ය ක්‍රමය

## බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා පිහිටුවා ඇති රෝහල්

- ජාතික රෝහල්
- ශික්ෂණ රෝහල්
- පළාත් මහ රොහල්
- දිස්ත්‍රික් මහ රෝහල්
- මූලික රෝහල්
- ප්‍රාදේශීය රෝහල්
- විශේෂිත රෝහල්

## බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ සෞඛ්‍ය සේවය මගින් පවත්වන රෝග නිවාරණ සේවා

- බරවා රෝග මර්දන ව්‍යාපාරය
- මැලේරියා මර්දන ව්‍යාපාරය
- ලාදුරු රෝග මර්දන ව්‍යාපාරය
- පිළිකා මර්දන ව්‍යාපාරය
- සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය
- බෝ නොවන රෝග මර්දන ව්‍යාපාරය
- ඩෙංගු මර්දන ඒකකය

# සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් ඔබ ප්‍රදේශයට සපයන සේවා

- බෝවන රෝග මර්දන වැඩසටහන්
- බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ළදරු හා මාතෘ සායන පැවැත්වීම
- ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීම
- පාසල් සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# සෞඛ්‍යමත් ජීවිතයක් ගත කිරීම සඳහා මහජනතාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග

- වෛද්‍ය උපදෙස් පිළිපැදීම
- යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම
- සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන භාවිතය
- ප්‍රමාණාවත් ව්‍යායාමවල යෙදීම
- දුම් බීමෙන් හා මත්ද්‍රව්‍යවලින් වැළකීම

# ආයුර්වේද වෛද්‍ය ක්‍රමය යටතේ පවත්වාගෙන යන ආයතන

- ආයුර්වේද ශික්ෂණ රෝහල්
- ආයුර්වේද පර්යේෂණ රෝහල්
- පළාත් සභා මගින් පාලනය වන ආයුර්වේද රෝහල්
- පළාත් සභා මගින් පාලනය වන ආයර්වේද මධ්‍යම බෙහෙත් ශාලා
- පළාත් සභා මගින් පාලනය වන නිදහස් බෙහෙත් ශාලා

# අධ්‍යාපනය

රටක් සතු වටිනාම සම්පත වන්නේ මානව සම්පතයි. මානව සම්පතෙහි අභිවෘද්ධිය හා යහපැවැත්ම කෙරෙහි බලපාන ප්‍රදාන සාධකය වන්නේ **අධ්‍යාපනයයි.** අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය මානව අයිතිවාසිකමක් ලෙසත් පිළිගෙන ඇත .



# අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීමට රජය ගෙන ඇති

- රජය මගින් ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා අධ්‍යාපනය නොමිලේ සැපයීම
- පාසල් පොත් නිළ ඇඳුම් නොමිලේ සැපයීම
- වාර්ෂික අයවැයෙන් විශාල මුදලක් අධ්‍යාපනය සඳහා වැය කිරීම
- වයස අවුරුදු 14 දක්වා ළමුන් සඳහා අධ්‍යාපනය අනිවාර්ය කිරීම
- ළගම පාසල හොඳම පාසල යන සංකල්පය මත 7000කට ආසන්න පාසල් සංඛ්‍යාවක් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම
- පෝෂණ අවශ්‍යතා සහිත යැයි හඳුනාගත් පාසල් සිසුන් සඳහා ආහාර වේලක් ලබාදීම

# අධ්‍යාපනය මගින් ඉටු කරන කාර්යභාරය

- නව දැනුම ලබාදීම
- සමාජානුයෝජනය කිරීම
- යහපත් පුරවැසියන් බිහි කිරීම
- ජාතික සමගිය පෝෂණය කිරීම
- ජාතික අවශ්‍යතාවන්ට ගැළපෙන පිරිස් සමාජයට දායාද කිරීම
- වැඩ ලෝකය හා ආර්ථිකය තුළ ඵලදායීව ක්‍රියාකාරී විය හැකි පුරවැසියන් බිහි කිරීම
- අයිතිවාසිකම් භුක්තිවිඳිමින් ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීම පිළිබඳ නිපුණතා සංවර්ධනය කර ගැනීම

# ප්‍රවාහනය

ප්‍රවාහන අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා අපට ලැබෙන පොදු ප්‍රවාහන සේවා නම්



- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- පෞද්ගලික බස් රථ සේවය
- ගුවන් සේවා





# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් ඩිපෝවක සේවා සැපයිමට දායක වන කාර්ය මණ්ඩලය

- ඩිපෝ කළමනාකරු
- සහකාර ඩිපෝ කළමණාකරුවන්
- ඩිපෝ පරීක්ෂකවරුන්
- වැඩ මූලික
- කාර්මිකයන්
- රියදුරන්
- කොන්දොස්තරවරුන්

# පොදු ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර

- ✓ මාර්ග නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම
- ✓ අධිවේගී මාර්ග ඉදි කිරීම
- ✓ නව බස්රථ ධාවනයට එක් කිරීම
- ✓ නව දුම්රිය මැදිරි හා දුම්රිය එංජින් ධාවනයට එක් කිරීම
- ✓ පෞද්ගලික බස්රථ සේවා දියුණු කිරීම සඳහා නීතිමය පියවර ගැනීම
- ✓ පෞද්ගලික බස්රථ සේවා දියුණු කිරීම සඳහා දිරිගැන්වීම් ලබාදීම
- ✓ මඟී ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීතිමය පියවර ගැනීම

# විදුලිය

## විදුලි බලයෙන් ඉටු කරගත හැකි අත්‍යවශ්‍ය කාර්යයන්

- නිවෙස් ආලෝක කිරීම හා ගෘහස්ථ කටයුතු සඳහා
- සෞඛ්‍ය සේවාවන් සඳහා
- කර්මාන්ත සඳහා
- වෙළෙඳ ආයතනවල අවශ්‍යතා සඳහා
- වීථි ආලෝක කිරීම සඳහා
- සන්නිවේදනය ඇතුළු වෙනත් විවිධ සේවා පවත්වාගෙන යාම සඳහා

# ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයක කාර්ය මණ්ඩලය

- ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු
- සහකාර විදුලි ඉංජිනේරු
- විදුලි අධිකාරී
- ලිපිකරු කාර්ය මණ්ඩලය
- විදුලි ශිල්පීන්
- කම්බි මාර්ගකරුවන්
- ක්ෂේත්‍ර සේවකයන්
- මනු කියවන්නන්
- රියදුරන්



# පණිවිඩ හුවමාරු සේවා

පණිවිඩ හුවමාරු සේවා වර්තමානයේ අත්‍යවශ්‍ය සේවා බවට පත්වීමට හේතු

- ✓ සමාජ සබඳතා පුළුල් වීම
- ✓ ජාත්‍යන්තර සබඳතා පුළුල් වීම
- ✓ කාර්ය බහුල වීම
- ✓ මිනිසාගේ අවශ්‍යතා සංකීර්ණ වීම

# පණිවිඩ හුවමාරු සේවා මගින් ඉටු කරන කාර්යයන්

1 අත්‍යවශ්‍ය පණිවිඩ ඉතා ඉක්මණින් ලබා දීම

2 අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කිරීම

3 රටේ පරිපාලන කටයුතු පහසු කිරීම

4 ප්‍රදේශ අතර සබඳතා පැවැත්වීම සඳහා සේවා සැපයීම

5 විදේශ රටවල් සමඟ සබඳතා පැවැත්වීම සඳහා සේවා සැපයීම

6 ව්‍යාපාරික කටයුතු පහසු කිරීම

7 සංචාරක කටයුතු සඳහා උපකාරී වීම

# තැපැල් සේවය

තැපැල් සේවය මගින් පහත සඳහන් සේවා ජනතාවට සැපයේ.



- මුද්දර විකිණීම
- ලිපි හා පාර්සල් යැවීම
- ටෙලිමේල් පහසුකම්
- දුරකථන පහසුකම්
- මුදල් ඇණවුම් මගින් මුදල් යැවීම
- විශ්‍රාම වැටුප් හා රජය මගින් සපයන මහජන ආධාර මුදල් ගෙවීම

# සන්නිවේදන සේවා

පොදු සේවා ලෙස ක්‍රියාත්මක වන සන්නිවේදන මාධ්‍ය

- පුවත්පත්
- ගුවන් විදුලිය
- රූපවාහිනිය
- අන්තර්ජාලය








# මාධ්‍ය මගින් ඉටු කෙරෙන කාර්යයන්

1 එදිනෙදා සිදු වන වැදගත් සිදුවීම් පිළිබඳ ජනතාව  දැනුවත් කිරීම

2 රසවින්දනය  හා විනෝදය සඳහා වැඩසටහන් ඉදිරිපත් කිරීම

3 විවිධ ක්ෂේත්‍රවලට අදාළව දැනුම වර්ධනය කිරීම

4 ජනතා අදහස්  පැමිණිලි ආදිය වගකිව යුතු අංශ වෙත යොමුකිරීම

5 තොරතුරු අනාවරණය මගින් ජනතා ශුභසාධනයට දායකවීම

6 ජනතාවට බලපාන අයහපත් තත්ත්වයන් පිළිබඳ දැනුවත් කර ආපදා හා විපත්වලින් ජීවිත හා දේපල හානි වැළැක්වීමට කටයුතු කිරීම

# ආරක්ෂක සේවා



## ශ්‍රී ලංකා පොලිසිය

**නීතිය හා සාමය සුරැකීම හා මහජන ආරක්ෂාව සැපයීම පොලිසියේ ප්‍රධාන කාර්යයයි.**

**ශ්‍රී ලංකා යුධ හමුදාව/ ශ්‍රී ලංකා නාවික හමුදාව /ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙන්ම සිවිල් ආරක්ෂක බලකාය** ද ආරක්ෂක සේවා සැපයීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.





# පොලිසිය

# පොලිසියෙන් සිදුවන සේවය




- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- මහජන ආරක්ෂාව සැපයීම
- අපරාධ පිළිබඳ මූලික විමර්ශන කටයුතු සිදු කිරීම
- අපරාධ සම්බන්ධ සැකකරුවන් නීතිය ඉදිරියට පැමිණවීම
- මාර්ග ආරක්ෂාව හා රථවාහන හැසිරවීමේ කටයුතු
- පොදු දේපල ආරක්ෂා කිරීම
- හදිසි අනතුරු විපත් සහ ආපදා අවස්ථාවල දී සේවා සැපයීම

# පොලිස් ස්ථානයක කාර්ය මණ්ඩලය

- පොලිස් ස්ථානාධිපති
- පොලිස් පරීක්ෂකවරුන්
- උප පොලිස් පරීක්ෂකවරුන්
- පොලිස් සැරයන්වරුන්
- පොලිස් කොස්තාපල්
- පොලිස් කාන්තාවන් / පොලිස් නිලධාරිනියන්

# ආරක්ෂක හමුදාවෙන් ඉටුවන සේවාවන්

- රටට එල්ලවිය හැකි යුද්ධමය තත්ත්වයන්ගෙන් රට ආරක්ෂා කිරීම
- අභ්‍යන්තර කැරලි කෝළාහල හා ත්‍රස්තවාදී කටයුතු මර්දනය කිරීම
- ජාතික ආරක්ෂාව සැලසීම
- රාජ්‍ය තාන්ත්‍රිකයන් පිළිගැනීම සඳහා සම්මාන ආචාර මුර පැවැත්වීම
- ජාතික දින උත්සවයේ හා වෙනත් ජාතික වශයෙන් වැදගත් වන උත්සව වලදී සම්මාන ආචාර පැවැත්වීම
- වැඩ වර්ජන වැනි අවස්ථාවලදී අත්‍යවශ්‍ය පොදු සේවා සැපයීමට සහය වීම
- පොදු දේපළ මානව සම්පත හා භෞතික සම්පත් ආරක්ෂා කිරීම සඳහා පොලිසියට සහය වීම

# සමුපකාරය

“**එකා සැමටත් - සැම එකාටත්** ” යන්න සමුපකාරයේ ආදර්ශ පාඨයයි

# සමුපකාරය මගින් සපයන සේවාවන්

1 පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම

2 ණය පහසුකම් සැපයීම

3 ප්‍රවාහන සේවා සැපයීම

4 බැංකු සේවා සැපයීම

5 අවමංගල සේවා සැපයීම

6 කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම හා අලෙවි කිරීම

7 රක්ෂණ සේවා සැපයීම

8 රෝහල් පවත්වාගෙන යාම

# ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමුපකාර සමිති

- විවිධ සේවා සමුපකාර සමිති
- සමුපකාර ණය දෙන සමිති
- කෘෂි නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති (තේ,පොල්,රබර් වැනි නිෂ්පාදන වලට සම්බන්ධ)
- කර්මාන්ත සම්පකාර සමිති (කොහු,පේෂකර්ම ආදී නිෂ්පාදන වලට සම්බන්ධ)
- රෝහල් සමුපකාර සමිති
- පාසල් සමුපකාර සමිති
- ප්‍රවාහන සේවා සමුපකාර සමිති

# රජය මගින් සපයනු ලබන වෙනත් පොදු සේවා

මිනිසා විසින් පරිසරය සුරකින විට පරිසරය විසින් මිනිසා සුරකිනු ලැබේ .පරිසරයේ ස්වාභාවික පැවැත්ම තහවුරු වන තරමට දූෂණය නොවූ පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය ද තහවුරු වේ.

විවිධ මිනිස් ක්‍රියාකාරකම් පරිසර දූෂණයට ප්‍රබල ලෙස බලපා ඇති අතර මේ නිසා මිනිසා ඇතුළු සියලුම ජීවින්ගේ පැවැත්මට තර්ජනයක් වී තිබේ. පරිසර සංරක්ෂණය කෙරෙහි වර්තමානයේ රජය වැඩි අවධානයක් යොමුකර ඇත්තේ මේ නිසාය .

# පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතන

- පරිසර අමාත්‍යංශය
- මධ්‍යම පරිසර අධිකාරිය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වන ජීවී දෙපාර්තමේන්තුව
- භූ විද්‍යා හා පතල් කැණිම් කාර්යාංශය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව





# පොදු සේවා සපයන ආයතන හා බැඳුණු යුතුකම් හා වගකීම්

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් වගකීම් |
| --- | --- | --- |
| ජල සම්පාදනය | උදා : ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ▪ පිරිසිදු පානීය ජලය සැපයීම<br>▪ සේවා අඛණ්ඩව සැපයීම<br>▪ ජලය අපතේ යෑම වැළැක්වීම<br>▪ වැඩි වන ඉල්ලුම සපුරාලීම<br>▪ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කිරීම<br>▪ සේවා සැපයීම තාවකාලිකව අත්හිටුවන අවස්ථාවලදී කල් ඇතිව පාරිභෝගිකයන් දැනුවත් කිරීම<br>▪ පාරිභෝගික පැමිණිලි පිළිබඳ ඉක්මණින් යහපත් ප්‍රතිචාර දැක්වීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් වගකීම් |
| --- | --- | --- |
| විදුලිය | උදා: ලංකා විදුලිබල මණ්ඩලය | • අඛණ්ඩව සේවා සැපයීම<br>• නිසි පරිදි නඩත්තු කටයුතු සිදු කිරීම<br>• ආරක්ෂාව සහතික කිරීම<br>• වැඩි වන විදුලිබල ඉල්ලුම සපුරාලීමට කටයුතු කිරීම<br>• මහජන පැමිණිලි පිළිබඳ ඉක්මණින් යහපත් ප්‍රතිචාර දැක්වීම<br>• විදුලි සැපයුම බිඳ වැටුණ අවස්ථාවලදී ඒවා ඉක්මණින් යථා තත්ත්වයට පත් කිරීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් |
| --- | --- | --- |
| සෞඛ්‍ය සේවය | උදා:<br>1 රෝහල<br>2 පෞද්ගලික රෝහල් | • රෝගීන්ට නිසි පරිදි ප්‍රතිකාර සැපයීම<br>• භාවිතයට සුදුසු ඖෂධ වර්ග සැපයීම<br>• බෝ වන රෝග හා බෝ නොවන රෝග වැළැක්වීමට ක්‍රියා කිරීම<br>• රෝගීන් රැකබලා ගැනීම හා අවශ්‍ය පහසුකම් සැපයීම<br>• අඛණ්ඩව සේවා සැපයීම<br>• වෛද්‍ය උපදෙස් සැපයීම හා දැනුවත් කිරීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් වගකීම් |
|---|---|---|
| සමුපකාරය | සමුපකාර සමිති<br>උදා: විවිධ සේවා සමුපකාර සමිති | • ගුණාත්මක සේවාවක් සැපයීම<br>• කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස සේවා නවීකරණය කිරීම<br>• පාරිභෝගික සේවා පහසු මිලට සැපයීම<br>• සමිති නායකත්වයට පත්වන අය අවංකව හා කැපවීමෙන් සමිතියේ දියුණුව සඳහා කටයුතු කිරීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් වගකීම |
|---|---|---|
| අධ්‍යාපනය | පාසල්<br>විශ්ව විද්‍යාල<br>පෞද්ගලික රෝහල් | • නිසි පරිදි අධ්‍යාපනය ලබාදීම<br>• නිපුණතා සංවර්ධනය කිරීම<br>• සමාජානුයෝගී කිරීම<br>• සමාජයට වැඩදායක පුරවැසියන් බිහි කිරීම<br>• ජාතික අවශ්‍යතාවන්ට ගැළපෙන පුරුැසියන් බිහි කිරීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් හා වගකීම |
|---|---|---|
| ප්‍රවාහනය | උදා:<br>1 ලංකා ගමනාගමන මණ්ඩලය<br>2 පෞද්ගලික බස්රථ සේවාව<br>3 ශ්‍රී ලංකා දුම්රිය සේවය | • කාර්යක්ෂම ලෙස සේවා සැපයීම<br>• මගී ආරක්ෂාව තහවුරු කිරීම<br>• සේවයට අදාළ ලෙස පමණක් ගාස්තු අය කිරීම<br>• ගාස්තුවට අදාළව ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් හා වගකීම |
|---|---|---|
| පණිවිඩ හුවමාරු සේවා | • තැපැල් සේවය<br>• මාධ්‍ය ආයතන | • කාර්යක්ෂමව හා ක්‍රමවත්ව සේවා සැපයීම<br>• සත්‍ය තොරතුරු ජනතාවට සැපයීම<br>• අපක්ෂපාතීව තොරතුරු සැපයීම<br>• හදිසි හා ස්වාභාවික විපත් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් වගකීම |
|---|---|---|
| ආරක්ෂක සේවා | උදා:<br>ශ්‍රී ලංකා පොලිසිය හා ආරක්ෂක හමුදා | • මහජන ආරක්ෂාව සහතික කිරීම<br>• මහජනයා සමග සුහදශීලීව කටයුතු කිරීම<br>• නීතිය හා සාමය සුරැකීම<br>• සමාජ විරෝධි ක්‍රියා මැඩපැවැත්වීම<br>• හදිසි ආපදා විපත් අවස්ථාවලදි ජනතාවට සහන සැලසීම |

| පොදු සේවා | සපයන ආයතන | පොදු සේවා සපයන ආයතනවලින් ඉටු විය යුතු යුතුකම් වගකීම් |
|---|---|---|
| පරිසර සංරක්ෂණය | උදා:<br>❖ පරිසර අමාත්‍යාංශය<br>❖ මධ්‍යම පරිසර අධිකාරිය<br>❖ වනජීවී දෙපාර්තමේන්තුව | ❖ පරිසර සංරක්ෂණය සඳහා උපරිම දායකත්වය සැපයීම<br>❖ පරිසර නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා උපරිම සහාය ලබාදීම<br>❖ පරිසර හානි පිළිබඳ මහජන පැමිණිලිවලට යහපත් ප්‍රතිචාර දැක්වීම |

# පොදු සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම්

| පොදු සේවාව | සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතුකම් |
|---|---|
| ජල සම්පාදනය | ➢ ජලය අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීම<br>➢ අනිසි ලෙස භාවිත කිරීමෙන් වැළකීම<br>➢ නියමිත වේලාවට බිල්පත් ගෙවීම<br>➢ ජල සැපයුමට අදාළ උපකාරය ආරක්ෂා කිරීම |
| විදුලිය | ➢ විදුලිය අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීම<br>➢ විදුලි සැපයුමට සම්බන්ධ උපකරණ ආරක්ෂා කිරීම<br>➢ බිල්පත් නියමිත කාලය තුළ ගෙවීම<br>➢ අයථා ක්‍රමවලින් විදුලිය පරිභෝජනයට නොගැනීම |

| පොදුසේවාව | සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| සෞඛ්‍යය | ➢ වෛද්‍ය උපදෙස් පිළිපැදීම<br>➢ සේවා සපයන කාර්ය මණ්ඩලවලට කාරුණික වීම<br>➢ නොමිලේ සපයන ඖෂධ අපතේ නොයැවීම<br>➢ යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම<br>➢ සේවා සපයන ආයතන සතු දේපළ ආරක්ෂා කිරීම |
| අධ්‍යාපනය | ➢ මැනවින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම<br>➢ ගුරු ගෞරවය රැකෙන පරිදි කටයුතු කිරීම<br>➢ තමාගේත් තමන් අධ්‍යාපනය ලබන ආයතනයේත් ගෞරවය රැකෙන පරිදි කටයුතු කිරීම<br>➢ ආයතනය සතු සම්පත් ආරක්ෂා කිරීම<br>➢ අනෙකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අයිතිවාසිකම් සුරැකීම |

| පොදු සේවාව | සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| ප්‍රවාහනය | ➢ ප්‍රවාහන සේවා සැපයුමට අදාළ දේපළ ආරක්ෂා කිරීම<br>➢ සේවාවට අදාළ ගෙවීම් සඳහා අවංක වීම<br>➢ ප්‍රවාහන සේවා භාවිත කිරීමේදී ආචාරශීලී වීම හා නීතිගරුක වීම<br>➢ පොදු ප්‍රවාහනසේවා භාවිතය නිසා තමන්ටත් රටටත් අත්වන ප්‍රයෝජන පිළිබඳ දැනුවත් භාවයෙන් කටයුතු කිරීම |
| ආරක්ෂක සේවා | ➢ අපරාධ ,සමාජ විරෝධී ක්‍රියා මැඩලීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම<br>➢ නීතිගරුක පුරවැසියකු ලෙස කටයුතු කිරීම<br>➢ පොලීසිය , ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් කටයුතු කිරීම |

| පොදු සේවාව | සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| සමුපකාර ව්‍යාපාරය | ➢ සමුපකාර ව්‍යාපාරයේ සාමාජිකත්වය ලබා ගැනීම<br>➢ එකිනෙකාට උපකාර කර ගැනීම<br>➢ සාමාජිකත්වය දරන සමිතියේ රැස්වීම්වලට නොකඩවා සහභාගී වීම |
| පණිවිඩ හුවමාරුව හා සන්නිවේදනය | ➢ කිසිවෙකුටත් හානිදායක නොවන ලෙස සන්නිවේදන සේවා භාවිත කිරීම<br>➢ ආචාරශීලී වීම<br>➢ රූපවාහිනි වැඩසටහන් නැරඹීම සඳහා තෝරා ගැනීමේදී විචාරශීලී වීම<br>➢ සමාජ අවශ්‍යතා පිළිබඳ මාධ්‍ය මගින් අදාළ අංශවල අවධානය යොමු කරවීම |

| පොදු සේවාව | සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| පරිසර සංරක්ෂණයට අදාළ ආයතන | ➢ පරිසර සංරක්ෂණයට දායක වීම<br>➢ පරිසරයට හානි කරන පුද්ගලයන් නීතියේ රැහැනට හසුකර දීමට කටයුතු කිරීම<br>➢ පරිසර සංරක්ෂණයට අදාළ නීතිරීති පිළිපැදීම<br>➢ පරිසර සංරක්ෂණය පිළිබඳ අන් අය දැනුවත් කිරීම |

**සවියෙන් පෙරට - අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම |
|---|---|---|---|
| 08 | පුරවැසි අධ්‍යාපනය | පළමු වාරය | පොදු සේවා |

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න**

1. පොදු සේවා යනු කුමක්ද?
2. අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා තුනක් ලියන්න
3. පොදු සේවා මහජනතාවට සපයන ආකාරය අනුව කොටස් තුනකට වෙන් කළ හැකිය.ඒ මොනවාද?
4. පොදු සේවාවල අවශ්‍යතාවය ඇති වීමට බලපාන හේතු තුනක් ලියන්න
5. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවා තුන මොනවද?
6. පොදු සේවාවල අවශ්‍යතාවය වර්ධනය කිරීමට බලපාන හේතු දෙකක් ලියන්න
7. පොදු සේවාවල පොදු ලක්ෂණ තුනක් ලියන්න
8. අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා හතරක් ලියන්න
9. සෞඛ්‍යමත් ජීවිතයක් ගත කිරීම සඳහා මහජනතාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග තුනක් ලියන්න.
10. පොලිසියෙන් සිදුවන සේවාවන් තුනක් ලියන්න
11. සමුපකාරයේ ආදර්ශ පාඨය කුමක්ද?
12. සමුපකාරය මගින් සපයන සේවාවන් හතරක් ලියන්න
13. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමුපකාර සමිති තුනක් නම් කරන්න
14. පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතන තුනක් නම් කරන්න
15. ප්‍රවාහන සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න

**ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

16. බ්‍රිතාන්‍ය යුගයේ ආරම්භ කරන ලද පොදු සේවාව කුමක්ද?
    1. අධ්‍යාපනය 2. සෞඛ්‍යය 3. විදුලිය 4. තැපැල් හා විදුලි පණිවිඩ සේවා

17. නිදහස් අධ්‍යාපනය පොදු සේවාවක් ලෙස ශ්‍රීලංකාවේ ක්‍රියාත්මක කිරීමේ ගෞරවය හිමිවන්නේ,
    1. ඊ.ඩබ්.අධිකාරම් මැතිතුමා 2. සී.ඩබ්.ඩබ්.කන්නංගර මැතිතුමා
    3. ආචාර්ය සේනක බිබිලේ මැතිතුමා 4. ඩී.එස්. සේනානායක මැතිතුමා

18. ඔබ ප්‍රදේශයේ නීතිය හා සාමය සුරැකීම හා මහජන ආරක්ෂාව සැපයීමේ ප්‍රධාන වගකීම ඉටුකරන ආයතනය වන්නේ,
    1. ශ්‍රී ලංකා යුධ හමුදාව 2. සිවිල් ආරක්ෂක බලකාය
    3. ශ්‍රී ලංකා ගුවන් හමුදාව 4. ශ්‍රී ලංකා පොලිසිය

19. ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී යන ආදර්ශ පාඨය අයත් වන්නේ,
    1.පොලිසියටය. 2.යුධ හමුදාවටය. 3.නාවික 4.සමුපකාරයටය

20. පොදු සේවාවන් ප්‍රධාන වශයෙන් වර්ග කීයකට බෙදිය හැකිද ?
    1. 1කි 2. 2කි 3. 3කි 4. 4කි

සැකසුම : නිරෝෂණී අමරතුංග
බප/කළු/බණ්ඩාරගම ජාතික පාසල

**සවියෙන් පෙරට - අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂය | වාරය | පොදු සේවා |
|---|---|---|---|
| 08 | පුරවැසි අධ්‍යාපනය | පළමු වාරය | පිළිතුරු |

1. ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පොදුවේ සියලුම ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි වනසේ රජය හා පෞද්ගලික අංශය මගින් සපයන සේවා පොදු සේවා වෙයි.

2. විදුලිය, අධ්‍යාපනය, සෞඛ්‍යය, තැපැල් සේවය

3.
   - නොමිලේ සපයන පොදු සේවා
   - සහනදායි අය කිරීමේ පදනම මත සපයන පොදු සේවා
   - මුදල් අය කර සපයන පොදු සේවා

4.
   - ජනතාවගේ ජීවන තත්ත්වය පහසු කිරීමට
   - සෑම පුද්ගලයෙකුටම සපයා ගත නොහැකි සේවා ලබා දීමට
   - අඩු ආදායම් ලාභීන්ට සහන සැලසීමට
   - පුද්ගලයන් අතර, ප්‍රදේශ අතර සබඳතා පවත්වාගෙන යාමට
   - සමාජ සාධාරණත්වය තහවුරු කිරීමට
   - සමාජ අවශ්‍යතා ඉටුකිරීම මගින් මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට

5. ප්‍රවාහනය
   තැපැල් හා විදුලි පණිවුඩ සේවා
   බැංකු සේවා

6. අවශ්‍යතා සංකීර්ණ වීම
   ජන සංඛ්‍යාව වර්ධනය වීම

7.
   - සියලුම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැකිවීම
   - ලාභ ඉපයීමට වඩා මහජන සුභ සිද්ධිය අරමුණු කරගෙන පවත්වාගෙන යාම
   - ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පවතවා ගෙන යාම
   - අඩු ආදායම් ලාභීන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම
   -

8.
   - සෞඛ්‍ය සේවය , අධ්‍යාපනය, ප්‍රවාහනය, විදුලිය, පණිවිඩ හුවමාරු සේවා හා සන්නිවේදන සේවා, ආරක්ෂක සේවා, සමුපකාරය

9.
   - වෛද්‍ය උපදෙස් පිළිපැදීම
   - යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම
   - සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන භාවිතය
   - ප්‍රමාණාවත් ව්‍යායාමවල යෙදීම
   - දුම් බීමෙන් හා මත්ද්‍රව්‍යවලින් වැළකීම

10.

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- මහජන ආරක්ෂාව සැපයීම
- අපරාධ පිළිබඳ මූලික විමර්ශන කටයුතු සිදු කිරීම
- අපරාධ සම්බන්ධ සැකකරුවන් නීතිය ඉදිරියට පැමිණවීම
- මාර්ග ආරක්ෂාව හා රථවාහන හැසිරවීමේ කටයුතු
- පොදු දේපල ආරක්ෂා කිරීම

11. "එකා සැමටත් - සැම එකාටත් "

12.

1 පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම
2 ණය පහසුකම් සැපයීම
3 ප්‍රවාහන සේවා සැපයීම
4 බැංකු සේවා සැපයීම
5 අවමංගල සේවා සැපයීම
6 කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම හා අලෙවි කිරීම
7 රක්ෂණ සේවා සැපයීම

13.

- විවිධ සේවා සමුපකාර සමිති
- සමුපකාර ණය දෙන සමිති
- කෘෂි නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති (තේ,පොල්,රබර් වැනි නිෂ්පාදන වලට සම්බන්ධ)
- කර්මාන්ත සම්පකාර සමිති (කොහු,පේෂකර්ම ආදී නිෂ්පාදන වලට සම්බන්ධ)
- රෝහල් සමුපකාර සමිති

14.

- පරිසර අමාත්‍යංශය
- මධ්‍යම පරිසර අධිකාරිය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වන ජීවී දෙපාර්තමේන්තුව
- භූ විද්‍යා හා පතල් කැණිම් කාර්යාංශය

15.

- ප්‍රවාහන සේවා සැපයුමට අදාළ දේපළ ආරක්ෂා කිරීම
- සේවාවට අදාළ ගෙවීම් සඳහා අවංක වීම
- ප්‍රවාහන සේවා භාවිත කිරීමේදී ආචාරශීලී වීම හා නීතිගරුක වීම
- පොදු ප්‍රවාහනසේවා භාවිතය නිසා තමන්ටත් රටටත් අත්වන ප්‍රයෝජන පිළිබඳ දැනුවත් භාවයෙන් කටයුතු කිරීම

16. 04
17. 02
18. 04
19. 01
20. 03

**සැකසුම : නිරෝෂණි අමරතුංග**
**බප/කළු/බණ්ඩාරගම ජාතික පාසල**